# කාමය අනිත්‍යයි කියන කාමයෙහි ගිජු ව අඹු දරුවන් සහ ධනය ඇසුරු කරන ධර්මධර උපාසකයන්ට රාගය දුරු කිරීමට ශක්තියක් නොමැත

## ඉසිදින්න ස්ථවිර ගාථා ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ථෙරථෙරීගාථාපාළි, ථෙරගාථා, දුකනිපාතය - පිටු අංක 70 - 71)

‘කාමයෝ අනිත්‍යය’යි කියන්නා වූ ධර්මධර උපාසකයෝ මා විසින් දක්නා ලදහ. ඔවුහු මැණික්, කර්ණාභරණ කෙරෙහි ඉතා ගිජු ව කාමයෙන් මැඩුනාහ. අඹු දරුවන් කෙරෙහි ද අපේක්ෂා ඇත්තෝය.

ඔවුහු ඒකාන්තයෙන් ම ධර්මය යථා ස්වභාවයෙන් නොදනිති. එසේ වුවත් ‘කාමයෝ අනිත්‍යය’යි කියති. ඔවුන්ට රාගය දුරු කිරීමට ශක්තියක් නොමැත. එ බැවින් අඹු දරුවන් හා ධනය ඇසුරු කරති.